45029

OL/2024(2025)/47/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 47 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

සිංහල සාහිත්‍ය රසාස්වාදය I, II
இலக்கிய நயம் சிங்களம் I, II
Appreciation of Sinhala Literary Texts I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය: ........................................

නිවැරදි බවට සහතික කරමි.

........................................
ශාලා නිරීක්ෂකගේ අත්සන

**උපදෙස්:**

✳ I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී වෙන වෙන ම භාරදිය යුතු ය.

✳ I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතු ය. **මේ සඳහා සපයා ඇති ඉඩකඩ පමණක් භාවිත කරන්න.**

✳ II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.

✳ I පත්‍රය සඳහා ලකුණු 40ක් ද II පත්‍රය සඳහා ලකුණු 60ක් ද හිමි වේ.

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

I පත්‍රය

| ප්‍රශ්න අංක | | ලකුණු |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| එකතුව | ඉලක්කමෙන් | |
| | අකුරෙන් | |

| | |
|---|---|
| ..................... පළමුවන පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... දෙවන පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... ගණිත පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... ප්‍රධාන පරීක්ෂක | ..................... සංකේත අංකය |

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය

(**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.)

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) "තොපගේ ස්වාමිපුත්‍රයාණන්ගේ ශ්‍රී විභූතිය බලව"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

..........................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

..........................................................................................

(ii) කුලුණු ගුණින් යුතු උතුමන් සිත මහරු
දුදන බසින් නො යෙදෙයි කරනට නපුරු
**නව රුවනින්** පිරි මහ සමුදුර ගැඹුරු
**තණ සුළකින්** උණු කළ හැකි වෙත් කවුරු

(අ) මෙහි මුල් කවි පද **දෙකෙහි** අදහස ලියන්න.

..........................................................................................

..........................................................................................

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**නව රුවනින්** ..........................................................................

**තණ සුළකින්** ..........................................................................

(iii) "නිදා ගැනීමට ඕනෑ තරම් වෙලා තියෙනවා. ඒ ගැන බය වෙන්න දෙයක් නෑ."

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ නම ලියන්න.

..........................................................................................

(ආ) මෙම නිර්මාණයේ රචකයාගේ නම ලියන්න.

..........................................................................................

(iv) කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

(අ) මෙහි මුල් කවි පද **දෙකෙහි** අදහස ලියන්න.

..........................................................................................

..........................................................................................

(ආ) මෙම පැදි පෙළේ රචකයා කවුද?

..........................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(v) "හාමිනේලා ඉක්මනට ම යන්ඩ වගේ. ඇයි නැටුම් බලන්ඩ හිටින්නෙ නැද්ද?"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ නම ලියන්න.

..............................................................................................

(ආ) මෙම නිර්මාණයේ රචකයාගේ නම ලියන්න.

..............................................................................................

(ලකුණු 04 × 5 = 20යි) 20

**2.** පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

බුදුහු ඒ අසා 'මහණෙනි, යම් සේ සෙවිලි නො දැන්මෙන් නපුරු කොට සොයාලූ ගෙය වැසි නැති විටෙක මුත් වැස්ස වට විට ම තෙමේ ද, එ පරිද්දෙන් සමථ භාවනා, විදර්ශනා භාවනා නැමැති සෙවිල්ල නො දන්නා හෙයින් තදංග විමුක්ති නැමැති එක් තරම් සෙවිල්ලකින් සොයාලූ සිත් නැමැති ගෙයක් කෙලෙස් නැමැති එක් තරම් වැස්සක් වටත් තෙමී මුත් නො හරණේ ය. යම් සේ සෙවිල්ල දන්නවුන් යහපත් කොට සොයාලූ ගෙය එක්තරා වැස්සකින් තබා මහත් වැස්සකිනුත් නො තෙමේ ද එපරිද්දෙන් ද්විප්‍රකාර භාවනා නැමැති තර සෙවිල්ලෙන් සොයා ලූ සිත් නැමැති ගෙය සසර මහ මුහුදු පුරන තරම් වූ කෙලෙස් මග වැසි වටත් නො තෙමේ'යි වදාළ සේක.

ඒ අසා නන්ද තෙරුන් වහන්සේගේ නුගුණ කියන්ට ගිය වහන්දෑ සෝවාන් ඵලාදියට පැමිණීමෙන් ලොවුතුරා ගුණය ලත් සේක. සත්‍ය අසත්‍ය නොදත් වහන්දෑ චතුස්සත්‍යය දත් සේක. ධර්ම සභායෙහි ද කථාවෙක් උපදනේ. බුදුවරුන් වහන්සේ නම් ඉතා ආශ්චර්ය සේක. ජනපද කල්‍යාණීන් නිසා නිවන් සම්පතින් පිරිහෙන්ට සිටි මලණුවන් වහන්සේට එක් තරම් දෙයක ඇවිටි ඇත්තවුන්ට වැඩියුරු දෙයක් පැලා ඇවිටි කළ එක් තරම් දෙයෙහි ඇවිටි හරවන්නා සේ දනවුකලණ බිසොවුන් කෙරෙහි කළ ඇවිටිය දෙව්ලොවට ගෙන ගොසින් දෙවඟනන් පැලා අරවාලූ සේක. මේ අනික් කාට පිළිවන් දැ'යි යන කථාව ය.

බුදුහුත් වහන්දෑ කරන කරන කතාව දිවකනින් අසා වදාරා, 'භික්ෂූහු නන්දයන් ශාසනයෙහි ඇලුම් කරවා ගත් නියාව අරභයා කතාව කෙරෙති. මම එ තෙනට ගියෙම් නම් 'හෙම්බා මහණෙනි, ඒ දැන් මතු නොවන්නේ වේ ද යටගිය දවසත් තෙල ලෙස ම උන්ට ඇති වූ ඇවිටියක් හැරවීමි කියාලා ඒ හඟවන්ට ජාතක කතාවක් ගෙන හැර දක්වමි. මාගේ මේ ජාතක දේශනාව පස්වා දහස මුළුල්ලෙහි බොහෝ දෙනාට බොහෝ ප්‍රයෝජන සාධා දෙන්නේ ය'යි සිතා වදාරා ධර්ම සභාවට වැඩ සුවිනීතව සුශික්ෂිතව වැඩහුන් පර්ෂද බලාපියා 'රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙලුම් වනයක් සේ මේ භික්ෂු පර්ෂද ඉතා හොබිති. මම පළමු කොට කතාවට ආරම්භයක් කෙළෙම් නම් මින් පෙරාතු කොට බසක් බැණ නැගෙන කෙනෙක් නැත. මම් ම පළමු කොට කථාව උපදවමි යි සිතා 'මහණෙනි, මා එන්නාට පෙරාතු කොට කෙසේ වූ කථාවක් කොට කොට හුණු දැ'යි විචාරා වදාරා මේ කතාව නියාව දැන්වූ කල්හි 'මහණෙනි, ඒ දැන් මතු නොවෙ'යි වදාරා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ භස්ම ප්‍රච්ඡන්න ජාත වේදයක් සේ භවයෙන් සැඟවී තුබූ ඉකුත් වත් කථාව දක්වන සේක්.

(i) 'සුවිනීතව සුශික්ෂිතව වැඩහුන් පර්ෂද බලාපියා' යන්නෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

.............................................................................................. (ලකුණු 04යි)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) මෙම පාඨයෙහි ඇතුළත් උපමා **දෙකක්** උපුටා දක්වන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

.............................................................................................................. (ලකුණු 04යි)

(iii) මෙම ඡේදයට අනුව ජනපද කල්‍යාණිය කෙරෙහි නන්ද තෙරුන්ගේ සිතෙහි වූ ඇල්ම දුරු කිරීමට බුදුන් වහන්සේ ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

.............................................................................................................. (ලකුණු 06යි)

(iv) මෙම ඡේදයට අනුව බුදුන් වහන්සේ ධර්ම සභාවට වැඩම කරවීමට හේතුව පැහැදිලි කරන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

.............................................................................................................. (ලකුණු 06යි)

20



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**නැතහොත්**

උපන්නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ

නම්බුව කැමති අය ඇති නම් නො වී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලොම් සිදුරක තරම් වත් අඬ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උපන් ගමේ බල උරුමය රැක ගන්ට
සටන් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙන් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉතින් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

වඳින්නේ නැතිව ලොකු නිලධාරින් ට
තමන්ගේ බලය උරුමය රැක ගන් ට
හිතින්වත් කැමති නම් එය කර ගන් ට
ඉතින් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අතත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
කතත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා

අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල්වැසියා යන සියල් ලම
අපේ අතට අවතන කර ගෙන වහම
අපේ නමට සලකත දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

(i) 'අයුක්තකට අත්දෙක ඔසවන්න එපා' යන්නෙන් කවියා අදහස් කරන්නේ කුමක් ද?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

..................................................................................................... (ලකුණු 04යි)

(ii) 'නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා' යැයි කවියා පවසන්නේ ඇයි?

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

..................................................................................................... (ලකුණු 04යි)

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) මෙම පද්‍ය පන්තියේ භාවිත ආකෘතිය පිළිබඳ කෙටියෙන් විමසන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

....................................................................................................................... (ලකුණු 06යි)

(iv) අභිමානවත් ජන සමාජයක් බිහි කිරීම සඳහා කවියා විසින් සිදු කරනු ලබන යෝජනා **දෙකක්** සඳහන් කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

....................................................................................................................... (ලකුණු 06යි)

20

* *

[හත්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| සිංහල සාහිත්‍ය රසාස්වාදය | I, II |
| இலக்கிய நயம் சிங்களம் | I, II |
| Appreciation of Sinhala Literary Texts | I, II |

**සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය**

※ **පළමුවන** ප්‍රශ්නය ද, **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න **දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.
※ මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

**1.** පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

පුතු ඉපදුණු මේ පොළොවේ
උරුමය පුතුටයි
ඒ පොළොවේ ඔද තෙද ගුණ
පුතුහට පිහිටයි

විහාර මහ මැණිවරුන්
ඉපදුණු පොළොවයි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණු පොළොවයි
රාසිහ මහසෙන් දෙවිඳුන්
ඉපදුණු පොළොවයි
මින් මතුවට ඒ පොළොවේ
උරුමය පුතුටයි

මහ සෑ රන් කොත මුදුනේ
ගන රන් කිරණයි
සිරිමා බෝ මැඩ සෙවනේ
සිහිලැල් පවනයි
දළදා හිමි රැඳි විමනේ
බුදුරැස් දහරයි
හැමදා හැම දුක් දුරලා
පුතු සිත සනසයි

සතර අතින් මුහුද නැඟී
පවුරු සදාලයි
වෙරළ දිගින් මුතු මතු වී
යසස උදා වෙයි
පොළොව පලා මිණි රුවනින්
ඉසුරු ගලා එයි
පොළොව එවන් පුතු උරුමෙන්
ලැබුව නිදානයි

- මෙම පද්‍ය පන්තියේ රචකයාගේ අරමුණ
- පද්‍ය නිර්මාණයේ අතීත උරුමය, බෞද්ධ උරුමය සහ ස්වභාව සෞන්දර්ය මතු කෙරෙන අවස්ථා
- භාෂා භාවිතයේ විශේෂතා
- පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු (ලකුණු 06 × 5 = 30යි)

[අවවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

2. 'තාත්වික සිද්ධි හා අවස්ථා නිරූපණය වෙසක් පහන කෙටිකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත.' නිදසුන් **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

3. 'කුස රජතුමා, උසස් රසවින්දනයෙන් හෙබි විශිෂ්ට කලා ශිල්පියෙකි.' නිර්දිෂ්ට ජාතක කතාවෙන් නිදසුන් **තුනක්වත්** දෙමින් ඔබේ අදහස දක්වන්න. (ලකුණු 15යි)

4. මාපිය, දූදරු සෙනෙහස මනුෂ්‍යයන්ට මෙන් ම සත්ත්ව ලෝකයට ද පොදු ය. ඇත් ගාලේ දරුපෙම පද්‍ය නිර්මාණය ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

5. මානුෂීය ගුණයෙන් හෙබි නිර්ව්‍යාජ කලා ශිල්පියෙකු ලෙස තුංමංහන්දිය නවකතාවේ අබිලිංගේ චරිතය නිරූපණය වන ආකාරය නිදසුන් **තුනක්වත්** දෙමින් විමසන්න. (ලකුණු 15යි)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/
0001121